# සම්පත් පැතිකඩ

# 2020

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
වීරඹුගෙදර

# පෙරවදන.

වීරඹුගෙදර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය පිළිබඳව 2020 වර්ෂය සඳහා සකස් කරන ලද ප්‍රාදේශීය සම්පත් පැතිකඩ තුලින්, මෙම කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 38 ට අදාළ සමාජ, ආර්ථික ,භෞතික, සංස්කෘතික හා මානව සම්පත් තොරතුරු ඉදිරිපත්කර ඇත. මෙම තොරතුරු රාජ්‍ය, රාජ්‍ය නොවන සහ පෞද්ගලික අංශ වලට ඉතා වැදගත් වේ.

මෙම සම්පත් පැතිකඩ සකස් කිරීමේදී අප වෙත මාර්ගෝපදේශකත්වය සැපයූ කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්/ දිසාපති ආර්.එම්.ආර්. රත්නායක මැතිතුමා සහ ක්‍රම සම්පාදන අධ්‍යක්ෂ චන්දිමා කේ. දිසානායක මහත්මියටත් වයඹ පළාත් ප්‍රධාන ලේකම් පී.බී.එම්.සිරිසේන මැතිතුමා සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කේ.ඒ.නන්දසිරි මැතිතුමාටත් මගේ කෘතඥතාවය පළ කරමි. තවද මෙම සම්පත් පැතිකඩ සකස් කිරීමේ කාර්යයේදී අවශ්‍ය සහයෝගය ලබාදුන් සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) එම්.පී.ඩී.කේ.එම්. අමරසේන මහත්මියටත් අදාළ කටයුතු සම්බන්ධීකරණය කර සම්පත් පැතිකඩ සකස් කිරීමේ කාර්යයේ නියලුනු සංවර්ධන අංශයට අනුයුක්ත සියළු නිළධාරින්ටත් අදාළ තොරතුරු කඩිනමින් අප වෙත ලබාදුන් සංවර්ධන නිලධාරි මහත්ම මහත්මීන් හා සෙසු ආයතන වෙත මගේ කෘතඥතාවය පළ කරමි.

මෙම සම්පත් පැතිකඩෙහි ඇතුලත් විය යුතු අමතර කරුණු තිබේ නම් ඒ පිළිබඳ විස්තර අප වෙත අනාවරණය කරන්නේ නම් එම තොරතුරු ඉදිරි සම්පත් පැතිකඩ සඳහා ඇතුලත් කළ හැකි වනු ඇත.

වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සියළු තොරතුරු ඒකරාශී කර ගනිමින් සකස් කළ සම්පත් පැතිකඩ තුලින් විශාල සමාජ මෙහෙවරක් වේවායි ප්‍රාර්ථනා කරමි.

ර්.එම්.එස්.පී.ඒකනායක

ප්‍රාදේශීය ලේකම්,

වීරඹුගෙදර.

# ස්තූතිය.

වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පවතින භෞතික සම්පත් , මානව සම්පත් හා අනිකුත් සියළුම සවිස්තරාත්මක තොරතුරු එක්රැස් කර 2020 වර්ෂය සඳහා විධිමත්ව සම්පත් පැතිකඩ එළි දැක්වීමට හැකිවීම පිළිබඳව ඉතාමත් සතුටු වෙමි. වෙනත් වර්ෂවලට සාපේක්ෂව වඩාත් ආකර්ශනීය අයුරින් සහ විස්තරාත්මක තොරතුරු ඇතුලත් කර මෙවර සම්පත් පැතිකඩ සැකසීමට හැකි විය. කොට්ඨාශයේ ක්‍රියාත්මක කෙරෙන විවිධ සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම,රජය මගින් ක්‍රියාත්මක කෙරෙන විවිධ සංවර්ධන වැඩ සටහන් සඳහා අවශ්‍ය තොරතුරු ලබාගැනීම, අධ්‍යයන කටයුතුවල නියුතු ශිෂ්‍ය ශිෂ්‍යාවන්, විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්, රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, හා මහජනතාවට මෙම සම්පත් පැතිකඩ තුළින් වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අදාල තොරතුරු පහසුවෙන් හා කඩිනමින් ලබා ගැනීමට හැකියාව ලැබේ.

2020 වර්ෂයේ සම්පත් පැතිකඩ සකස් කිරීමේදි උපදෙස් ලබදෙමින් මග පෙන්වීම් කළ ඊ.එම් එස්.පී ඒකනායක ප්‍රාදේශීය ලේකම්තුමිය ඇතුළු මාණ්ඩලික නිලධාරින් සියළු දෙනාටත්, සංවර්ධන අංශයේ මෙම විෂයභාර සංවර්ධන නිළධාරින් ඇතුළු සහය දැක් වූ සංවර්ධන අංශයේ සංවර්ධන නිළධාරි සියළු දෙනාටත්, කළමනාරණ සහකාර මහත්ම මහත්මීන්ටත් සියළුම ක්ෂේත්‍ර නිලධාරී මහත්ම මහත්මීන් ඇතුළු නිලධාරී මණ්ඩලයට මාගේ විශේෂ ස්තූතිය පුද කරමි.

එමෙන්ම වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ සියළු තොරතුරු ඒකරාශී කරමින්, කෙටි කාලයක් තුළ අවශ්‍ය තොරතුරු ලබා දෙමින් අගනා සහයක් ලබාදුන් වසම් භාර ආර්ථික සංවර්ධන නිලධාරී මහත්ම මහත්මීන් සියළු දෙනාටත්, ආයතනික මට්ටමින් අවශ්‍ය තොරතුරු ලබාදුන් සෙසු රාජ්‍ය ආයතනවලටත් මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි.

එම්.පී.ඩී.කේ.එම්. අමරසේන

සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)

# පටුන

පිටු අංකය


- පෙරවදන 01
- ස්තුතිය 02
- පටුන 03
- ඇමුණුම 04-5
- හැඳින්වීම 06
- පිහිටීම ( සිතියම් හා මායිම් ඇතුළත්ව) 07
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිළධාරී කොට්ඨාශ හා මාර්ග දැක්වෙන සිතියම භූගෝලීය පිහිටීම දැක්වෙන සිතියම හා භූගෝලීය පිහිටීම , ජල සම්පත්, පසෙහි ස්වභාවය,ඓතිහාසික පසුබිම ,දේශගුණය/ 08-09
- පරිපාලන බෙදීම 10
- භූගෝලීය පිහිටීම 11
- ජල සම්පත හා පසෙහි ස්වභාවය 12
- ඓතිහාසික පසුබිම හා දේශගුණය 13
- ජනගහනය/ජන ඝනත්වය 14
- අධ්‍යාපන මට්ටම අනුව ජන සංඛ්‍යාව/ සේවා නියුක්තිය/වියුක්තිය 15
- විදේශ රැකිය හා පුහුණු ශ්‍රමයේ සේවා නියුක්තිය 16
- පවුලක සාමාන්‍ය ආදායම/නිවාස වල ස්වභාවය හා අයිතිය 17
- කෘෂිකර්මාන්තය/ඉඩම්පරිහරණය/පොහොරවැඩසටහන 18-21
- සත්ත්ව පාලනය 22-23
- මිරිදිය ධීවර කර්මාන්තය 24-25
- ඉඩම් පරිහරණය 26
- වාරි කර්මාන්ත 27-28
- කර්මාන්ත 28-29
- සංචාරක කර්මාන්තය 30
- විදුලි බල පහසුකම්/පානීය ජල/සනීපාරක්ෂාව/මාර්ග 31-32
- ප්‍රවාහන/තැපැල් හා විදුලි සංදේශ සේවා 33
- සෞඛ්‍ය සේවා/අධ්‍යාපනය 34-35-36
- ආගමික /සංස්කෘතික හා විනෝදජනක ස්ථාන/නීතිය හා සාමය 37-38
- වානිජ ආයතන 38
- වෙළඳපල හා සේවා මධ්‍යස්ථාන 39
- රාජ්‍ය නොවන සංවිධාන හා ස්වේච්ඡා සංවිධාන/යෞවන කටයුතු /ක්‍රීඩා පහසුකම් හා පොදු පහසුකම 40-41
- සමාජ සුභසාධන කටයුතු 41-42
- ළමා නිවාස/වැඩිහිටි නිවාස/අඳ ගොළු බිහිරි පාසල් තොරතුරු 42-43
- පාරිසරික තොරතුරු 43-44
- ප්‍රාදේශීය ලේකම් කොට්ටාශයට අයත් රාජ්‍ය ආයතන තොරතුරු 45
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සංවර්ධන විභවතා 46-47
- සංවර්ධන වැඩසටහන් 47
- ඇමුණුම් 48-119

# ඇමුණුම්


| ඇමුණුම | පිටු අංකය |
|---|---|
| • නිවාස/පවුල්/මුළු ජනගහනය | 48 |
| 01. ජනගහන ව්‍යාප්තිය - ජාතීන් අනුව | 49 |
| 02. ජනගහන ව්‍යාප්තිය - ආගම් අනුව | 50 |
| 03. ජනගහන ව්‍යාප්තිය - වයස් කාණ්ඩය අනුව | 51 |
| 04. අධ්‍යාපන මට්ටම අනුව ජනගහනය | 52-53 |
| 05. අධ්‍යාපන මට්ටම අනුව සේවා නියුක්තිය | 54 |
| 06. අධ්‍යාපන මට්ටම අනුව සේවා වියුක්තිය | 55 |
| 07. රැකියාවේ බෙදී යාම ආංශික වශයෙන් | 56 |
| 08. විදේශ රැකියා | 57 |
| 09. පුහුණු ශ්‍රමයේ සේවා නියුක්තිය | 58-59 |
| 10.. නිවාස වල ස්වභාවය | 60 |
| 11.නිවාසවල අයිතිය | 61 |
| 12. ඉඩම් අයිතියේ ස්වභාවය | 62 |
| 13.-1 වාරිමාර්ග තොරතුරු (වැව්) | 63 |
| 13-2 වාරිමාර්ග තොරතුරු (ඇස මාර්ග හා අමුණු) | 64 |
| 14. කෘෂි ළිං | 65 |
| 15. ගෘහ කර්මාන්ත | 66-67 |
| 16-1 විදුලිබල පහසුකම් ව්‍යාප්තව ඇති අයුරු | 68 |
| 16-2 වෙනත් විදුලි බල පහසුකම් | 69 |
| 17. පානීය ජල සම්පාදනය | 70 |
| 18. ක්‍රියාත්මක පානීය ජල යෝජනා ක්‍රම | 71 |
| 19. සනීපාරක්ෂාව | 72 |
| 20.මාර්ග බෙදී යාම | 73 |
| 21. ප්‍රවාහන පහසුකම් | 74 |
| 22. විදුලි සංදේශ පහසුකම් | 75 |
| 23. පෙර පාසල් | 76 |
| 24. දිවා සුරැකුම් මධ්‍යස්ථාන | 77 |
| 25. දහම්පාසල් තොරතුරු | 78 |
| 26. ආගමික සිද්ධස්ථාන | 79-80 |
| 27. සංස්කෘතික මධ්‍යස්ථාන හා කලායතන | 81 |

28. සිවිල් ආරක්ෂක කමිටු 82
29. ග්‍රාම සංවර්ධන සමිති 83,84,85
29-2.අවමංගල්‍යාධාර හා සුභසාධන සමිති 86,87,88
29-3.වැඩිහිටි සංවිධාන 89,90
29-4. කාන්තා සංවිධාන 91,92
29-5. ක්‍රීඩා සමාජ 93,94,95
29-6. යෞවන සමාජ 96,97
29-7. ප්‍රජා මංණ්ඩල 98
29-8. ගොවි සංවිධාන 99,100
29-9.ළමා සමාජ 101
30.පවුලක සාමාන්‍ය ආදායම 102
31. වගා කළහැකි කුඹුරු ප්‍රමාණය 103,104
32. වී වගාවට ජලය ලබාගන්නා ආකාරය 105,106
33. ඉඩම් අයිතියේ ස්වභාවය (සින්නක්කර) 107
33-1. ඉඩම් අයිතියේ ස්වභාවය (බලපත්‍ර ලාභී) 108
33-2. ඉඩම් අයිතියේ ස්වභාවය (මධ්‍යම පාන්තික) 109
33-3. ඉඩම් අයිතියේ ස්වභාවය (අනවසර) 110
34. පාසල් තොරතුරු 111
35. වානිජ ආයතන 112
36. අළෙවිසැල් හා සේවා මධ්‍යස්ථාන 113,114
37. පොදු පහසුකම් 115
38. කර්මාන්ත ශාලා 116,117
39. ආයුර්වේද වෛද්‍යවරුන් පිළිබඳ විස්තර 118
40. පරිපාලන බෙදීම 119

# හැඳින්වීම

වයඹ පළාත කුරුණෑගල දිස්ත්‍රික්කයේ වියළි හා තෙත් දේශගුණික ලක්ෂණ දෙකකට අයත් පොල්ගහවෙල මැතිවරණ කොට්ඨාශය පිහිටා ඇති ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ දෙක අතරින් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් වශයෙන් මෙම කොට්ඨාශය හැඳින්විය හැකිය. පොල්ගහවෙල මැතිවරණ කොට්ඨාශය පොදුවේ තෙත් දේශගුණයෙන් යුත්ත වන කොට්ඨාශයක් වශයෙන් හැඳින්විය හැකි වුවත් , පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තෙත් දේශගණයක් සහිත කොට්ඨාශයක් වශයෙන්ද තෙත් හා අර්ධ වියළි දේශගුණයෙන් යුත් අනෙක් ප්‍රදේශය වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වශයෙන්ද හැඳින්වේ.

වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය විශාලත්වය වර්ග කිලෝමීටර් 96.183 ක් ද අක්කර අනුව බලන විට අක්කර 23757.28(හෙක්ටයාර් 9618.33) කින්ද යුත්තය. මෙහි ග්‍රාම නිලධාරී කොට්ඨාශ 38 කින් අන්තර්ගත වන අතර ගම්මාන වශයෙන් ගත්විට ගම්මාන 114 ක් ඇත. මුළු ජනගහනය 37435 කි. පවුල් සංඛ්‍යාව 11611කි. 99.4% ක බහුතර සිංහල ජනතාවක් ජීවත්වන මෙම කොට්ඨාශය තුළ අන්‍ය ජාතීන් සුළු පිරිසක් ජීවත් වේ. ආගමික වශයෙන් ගත්විට 97.5% ක බෞද්ධ ජනතාවක් ජීවත් වන බව සංඛ්‍යා ලේඛණ අනුව පැහැදිළි වේ. මහජනාධාර ලබන පවුල් සංඛ්‍යාව 4399 ක් වේ.(ොකාට්ඨාශය තුළ සියළුම අාධාර ලබන්නන්)

සමස්ථයක් ලෙස ගත්කල තැනිතලා භූමි ප්‍රදේශයකින් යුක්ත වුවද තැනින් තැන පොළව මට්ටමින් උඩට නැගුන ශේෂ කඳු වැටි කිහිපයක්ද දක්නට ඇත. ස්වභාවික සම්පත් ලෙස කළු ගල් හා මැටි කර්මාන්තය සඳහා සුදුසු මැටිද මෙම ප්‍රදේශයේ දක්නට ඇත. කළුගල් මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පුරාම ව්‍යාප්තව ඇති බව විශේෂයෙන් දක්නට ඇති අතර ඒ නිසාම ඒ හා බැඳුණු කර්මාන්ත සඳහා යොමුවීමේ ප්‍රවනතාවයකුත්, ඒ ආශ්‍රිත පරිසර ගැටළු සමූහයකුත්, ප්‍රමාණවත් පානීය ජල අවශ්‍යතා ලබාගැනීමේ ගැටළු ද වර්ධනයවී ඇති බව ඉදිරිපත් වන ජනතා අවශ්‍යතා හා ගැටළුවලදී මනාව පැහැදිලිවේ.

කෘෂිකර්මය පදනම් කර ගත් ආර්ථික රටාවක් මෙම ප්‍රදේශයේ ඇති අතර පොල් හා වී ප්‍රධාන වැවිලි බෝග වේ. වැව් 20 හා අමුණු 23ක් පදනම් කර ගනිමින් කෘෂිකාර්මික කටයුතුවල නියළුනද වර්ෂාපතනය, කෘෂිකර්මාන්තය සඳහා ප්‍රධානම ජලය සපයන ජල මූලාශ්‍රය බවට පත්වී ඇත. දකුණු උතුරු දිශාගතව ගලා බස්නා කොළමුණු ඔය හා මගුරු ඔය මෙම ප්රාදේශීය ලේකම් කොට්ඨාශය ආවරණය කරමින් ගලා බස්නා ප්‍රධාන ජල මූලාශ්‍රයන් දෙකය. දේශගුණික තත්වය සැලකීමේදී සෙල්සියස් අංශක 32.73 ක වාර්ෂික සාමාන්‍ය උෂ්ණත්වයක් හා මිලිමීටර් 132.4 ක වාර්ෂික සාමාන්‍ය වර්ෂාපතනයක් ද මෙම කොට්ඨාශය තුළ 2020 වර්ෂයේදී දක්නට ලැබිණි.

# 01. පිහිටීම

වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පරිපාලන සීමා මායිම් වශයෙන් උතුරට බමුණාකොටුව හා මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් ද දකුණට පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ද නැගෙනහිරට කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ද බටහිරට නාරම්මල හා කුලියාපිටිය නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ද මායිම්ව පිහිටා ඇත. (සිතියම් අංක 01)

පිහිටීම අනුව සලකා බැලීමේදී උතුරට අවසාන ගම් පිඹුරු අනුව අංක 2605 වදුරුස්සේගම ගම් මායිම් පනාගමුව හා කළුදැලිය පොදු ගම් මායිම් ඔස්සේ නැගෙනහිරට අංක 1222 පනාගමුව , 1210 ඊතනවත්ත , 1219 දම්පිටිය , 1204 දිවුල්ගස්පිටිය, යන ග්‍රාම නිලධාරී කොට්ඨාශවල දකුණු මායිම් ඔස්සේ මීටර් 14750 ක් පමණ නැගෙනහිරට මගුරු ඔය මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ඇති රේඛාවද නැගෙනහිරට ඇදි රේඛා ලක්ෂ්‍යය සිට දකුණු දිශාවට අංක 219 ඒ බමුණාවල සිට 220 රත්ගල්ල ගම් මායිම් බටහිර මායිම් දිගේ දකුණු දිශාවට පැමිණෙන බඩහැද්දර ගම්මානය එකතුවන ලක්ෂ්‍යද දකුණට ඉහත කී ලක්ෂ්‍යයේ සිට බඩහැද්දර ගම්මානයේ දකුණු මායිම් දිගේ බඹරගහපැළැස්ස බටහිර ගම්මානය හමුවන ලක්ෂ්‍යය දක්වා පැමිණ එතැන් සිට බස්නාහිර දිශාවට වදාකඩ , හානාගම , යටිහේන , නිල්වත්තේගම , දෙමටගෙදර , කෙසෙල්වත්තේහේන , ගින්නේරිය යන ගම්වල උතුරු මායිම් දිගේ බටහිරට උඩුකහ සහ රකවපත්තු කෝරළේ මායිම් හමුවන ලක්ෂ්‍යයද වේ. බස්නාහිරට ඉහතකී උඩුකහ හා රකව පත්තුකෝරළේ මායිම් හමුවන ලක්ෂ්‍යද වේ. බස්නාහිරට ඉහතකී උඩුකහ හා රකව පත්තු කෝරළේ මායිම් හමුවූ ලක්ෂෝයය් සිට 286 කරගහලප්පල , 293 මීවැව , ගනේගොඩ , 280 කරගහගෙදර , 379 ඉහළ පොතුහැර යන ග්‍රාම නිලධාරී කොට්ඨාශවල නැගෙනහිර මායිම් ඔස්සේ වයඹ කෝණ ලක්ෂ්‍යයන් ද මායිම් වේ.

## පරිපාලන බෙදීම - වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ග්‍රාම නිලධාරී කොට්ඨාශ 38 කින් සමන්විත වේ. මෙම ග්‍රාම නිලධාරී කොට්ඨාශ කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ අංක 843 සිට 880 දක්වා වේ.ග්‍රාම නිලධාරී වසම් සහ එහි විශාලත්වය පහත සඳහන් වේ.

| අනු අංකය | වසම් අංකය | ග්‍රාම නිලධාරී කොට්ඨාශය | විශාලත්වය (හෙක්ටයාර්) |
|---|---|---|---|
| 1 | 843 | උහුමීය | 152.570 |
| 2 | 844 | ක්ලෝවිස්වත්ත | 178.266 |
| 3 | 845 | සඳගල උතුර | 69.058 |
| 4 | 846 | සඳගල දකුණ | 96.360 |
| 5 | 847 | පිදුරුවැල්ල | 319.594 |
| 6 | 848 | දමුණුගල | 273.020 |
| 7 | 849 | බුළුපිටිය | 157.388 |
| 8 | 850 | ගලබඩගම | 175.054 |
| 9 | 851 | වේවැල්පොල | 170.236 |
| 10 | 852 | අඹහැර | 356.522 |
| 11 | 853 | රංජනගම | 239.294 |
| 12 | 854 | ගොඩවිට | 202.356 |
| 13 | 855 | කණුමලේ | 473.770 |
| 14 | 856 | පරකුඹුර | 261.778 |
| 15 | 857 | අල්ගම | 215.204 |
| 16 | 858 | තම්මිට | 321.200 |
| 17 | 859 | උඩුගම | 197.538 |
| 18 | 860 | කදුරුවැල්ල | 258..566 |
| 19 | 861 | සැවුන්දන | 163.812 |
| 20 | 862 | දෙහිකුඹුර | 348.502 |
| 21 | 863 | පූගල්ල | 179.872 |
| 22 | 864 | කළුගමුව | 300.322 |
| 23 | 865 | ගිනිපෙන්ද | 228.052 |
| 24 | 866 | හුරුක්ගමුව | 464.134 |
| 25 | 867 | හංවැල්ල | 245.718 |
| 26 | 868 | යන්තම්පල | 195.932 |
| 27 | 869 | වීරඹුගෙදර | 248.930 |
| 28 | 870 | ගෝනව | 272.714 |
| 29 | 871 | මඩවල උතුර | 273.020 |
| 30 | 842 | මඩවල දකුණ | 223.234 |
| 31 | 873 | යාලව | 573.343 |
| 32 | 874 | මුදුන්න | 211.992 |
| 33 | 875 | බමුණුගෙදර | 240.900 |
| 34 | 876 | පතින්වත්ත | 268.202 |
| 35 | 877 | මැදගම | 510.708 |
| 36 | 878 | ලෝකාහෙට්ටිය | 189.508 |
| 37 | 879 | ගල්ලැහැර | 122.056 |
| 38 | 880 | කඩදුන්න | 240.900 |

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුළු හෙක්ටයාර් ප්‍රමාණය - 9618.33

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුළු අක්කර ප්‍රමාණය - 23757.28

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුළු වර්ග ප්‍රමාණය - 96.18

## භූගෝලීය පිහිටීම

වයඹ පළාතට අයත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ දකුණු අර්ධයේ මධ්‍ය ප්‍රදේශයේ වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පිහිටා ඇත. සාපේක්ෂ පිහිටීම ගත්විට උතුරින් බමුණාකොටුව හා මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලින් ද දකුණින් පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් ද නැගෙනහිරින් කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් ද බටහිරින් නාරම්මල හා කුලියාපිටිය නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් ද මායිම් වේ.

දණ්ඩගමුව 1: 63360 පරිමාණයේ හා කුරුණෑගල 1 : 63360 පරිමාණයේ සිතියම් තුළ නැගෙනහිර ග්‍රිඩ් අංක 240 -260 සහ උතුරින් ග්‍රිඩ් අංක 130 – 150 තුළට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය නිරපේක්ෂ පිහිටීම සීමා වේ.

වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නැගෙනහිර මායිමෙන් ගලා යන මගුරු ඔය ප්‍රධාන ස්වභාවික ජල ප්‍රවාහය වේ. මීට අමතරව කොළමුණු ඔය, ප්‍රදේශයේ මධ්‍යයේ සිට වයඹ දිසානුගතව ගලා යයි. හීලවගෙදර වැව, කළුදැලිය වැව ,කන්දේවත්ත වැව, පහල තිබ්බටුවාව වැව, රංජනගම වැව, කොට්ඨාශයේ වැව් අතරින් කීපයකි.ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ උන්නතාංශය වැඩිම ප්‍රදේශය ලෙස දකුණ මායිමේ අල්ගම කන්ද කැපී පෙනේ. සමස්තයක් ලෙස ගත් කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ භූමිය තැනිතලා භූ ලක්ෂණ පෙන්වයි.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 96.18කි. (හෙක්ටයාර් 9618.334) මෙම භූමි ප්‍රමාණයෙන් 93 % ක් 0% -8% දක්වා වූ බෑවුම් කළාපයට අයත්වන අතර එය ප්‍රමාණයෙන් හෙක්ටයාර් 8974.33 කි. මේ අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සමස්ථයක් ලෙස ගත් කල තැනිතලා භූ ලක්ෂණ පෙන්වන බව කිව හැකිය. 60% බෑවුම ඉක්මවා ගිය ප්‍රමාණය හෙක්ටයාර් 38.54 කි එය මුළු භූමි ප්‍රමාණයෙන් 0.4% කි. එය ඉතා සුළු භූමි ප්‍රමාණයක් වන අතර මධ්‍යස්ථ බෑවුම කලාපයට ඉතිරි භූමි ප්‍රමාණය අයත් වෙයි.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් වලින් වැඩි ප්‍රමාණයක් ගල් සහිත බවින් යුතුවීම හා ගල් තලා වශයෙන් දැකිය හැකිවීම විශේෂිත ලක්ෂණයක් වේ.

## 1.2 ජල සම්පත

නැගෙනහිර සීමාවෙන් ගලායන මගුරු ඔයද එම මායිමට ආසන්නයෙන් ගලා යන රකව ඇල හා ප්‍රදේශය මැදින් ගලා බස්නා කොළමුණු ඔය ප්‍රධාන ජල මාර්ගය සතුව වුවද වාර්ෂික ජල අවශ්‍යතාවය සපිරීමට ප්‍රමාණවත් තරම් ජලය නොමැත. එයට හේතුව ලෙස දැකිය හැක්කේ අවුරුද්දේ සුළු කාලයකට වර්ෂාව සීමා වීමයි. මීට අමතරව ජල සම්පත් වශයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ තැනින් තැන විසිරී පවතින කුඩා වැව් කීපයක්ද දැකිය.

## 1.3 පසෙහි ස්වභාවය

ලුණුවිල පොල් පර්යේෂණායතනය විසින් 1994 වර්ෂයේදී දී සිදු කරන ලද සමීක්ෂණ අනුව වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ප්‍රධාන පාංශු කාණ්ඩ 6ක්ද , ඒ තුල ප්‍රධාන කොටස් තුනක් ද හදුනාගෙන ඇත. පාංශු ව්‍යාප්තිය බෑවුම් අන්තරයට අනුව 0% - 8% දක්වා සහ 8% - 16%වේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උතුරු අර්ධයට වඩා දකුණු අර්ධය තුළට පාංශු පිහිටීමේ ඝණත්වය වැඩිය. මෙම පාංශු වර්ගීකරණය අනුව හදුනාගත් ප්‍රධාන පාංශු වර්ග 06 පහත පරිදි වේ.

01. කුලියාපිටිය ශ්‍රේණිය J 6 හා K 4
02. මැල්සිරිපුර ශ්‍රේණිය J10
03. කුරුණෑගල ශ්‍රේණිය J20
04. කිරිවානා ශ්‍රේණිය K2
05. අඩිගම ශ්‍රේණිය K3

මීට අමතරව හදුනාගත් උප කොටස් වශයෙන්

- කුඹුරු ආශ්‍රිත දියළු පස
- බාදිත ප්‍රදේශ
- ශේෂ කඳු සහිත තැන්න

දැක්විය හැකිය.

## 1.4 ප්‍රදේශයේ ඓතිහාසික පසුබිම

වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ඓතිහාසික පිහිටීම ගැන සදහන් කිරීමේදී ගම හා බැදුන නොයෙකුත් ජනප්‍රවාද ඓතිහාසික පසුබිම තුළ ඇත.මෙම ප්‍රදේශයේ ඓතිහාසික විහාරස්ථාන කිහිපයක් ඇත. පුරා විද්‍යා දෙපාර්තමේන්තුව ප්‍රකාශ කරන පරිදි අල්ගම ග්‍රාම නිලධාරී වසමේ රමණීය වන පෙතක පිහිටා ඇති අල්ගම කන්ද විහාරස්ථානය වළගම්බා රජ සමය දක්වා ම දිව යන්නකි. එහි තිබී වැදගත් ඓතිහාසික සාධක සොයා ගෙන ඇත. එමෙන්ම හුරුක්ගමුව,මුදුන්න,සේරුවාගල,සැවැන්දන යන පුරාණ රජමහා විහාරයන් සමග බැදී ඇති ඓතිහාසික කරුණු තුළින්ද ප්‍රදේශයේ ඓතිහාසික වැදගත්කම මතු කරයි.

## 1.5 දේශගුණය

### 1.5.1 වර්ෂාපතන සාමාන්‍ය අගයන් (මිලි ලීටර්)

| මාසය | වර්ෂය | | | |
|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 |
| ජනවාරි | | 26.2 | 26.8 | 22.3 |
| පෙබරවාරි | | 28.15 | 28.3 | 0.6 |
| මාර්තු | | 29 | 29.5 | 52.7 |
| අප්‍රේල් | | 28.9 | 297 | |
| මැයි | | 27.9 | 29.9 | 373.5 |
| ජූනි | | 28 | 28.9 | 95.3 |
| ජූලි | | 28.1 | 28.5 | 119.3 |
| අගෝස්තු | | 27.8 | 27.7 | 83 |
| සැප්තැම්බර් | | 28.8 | 27.7 | 370.5 |
| ඔක්තෝබර් | | 27.4 | 26.9 | |
| නොවැම්බර් | | 26.95 | 27.7 | 276.1 |
| දෙසැම්බර් | | 26.4 | 26.7 | 195.7 |
| සාමාන්‍ය අගය | | 27.8 | 50.47 | 132.4 |

### 1.5.2 උෂ්ණත්ව සාමාන්‍ය අගයන් (උපරිම උෂ්ණත්වය - සෙල්සියස් අංශක C )

| මාසය | වර්ෂය | | | |
|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 |
| ජනවාරි | | 6.4 | 0 | 33.2 |
| පෙබරවාරි | | 14.7 | 85.3 | 34.6 |
| මාර්තු | | 148 | 32.7 | 36.7 |
| අප්‍රේල් | | 178.9 | 145.5 | 35.3 |
| මැයි | | 625.5 | 9.9 | 32.8 |
| ජූනි | | 159.6 | 156.4 | 32.1 |
| ජූලි | | 44.6 | 96.2 | 32 |
| අගෝස්තු | | 70.7 | 137.1 | 32.2 |
| සැප්තැම්බර් | | 121 | 157.3 | 30.3 |
| ඔක්තෝබර් | | 471.2 | 479.8 | 31.7 |
| නොවැම්බර් | | 350.4 | 322.1 | 31.9 |
| දෙසැම්බර් | | 99.4 | 156.1 | 30 |
| සාමාන්‍ය අගය | | 190.87 | 148.2 | 32.7 |

## 2. ජනගහනය/අධ්‍යාපනය/සේවා නියුක්තිය/ආදායම්/නිවාස/

සංක්‍රමණ/විදේශගත වූවන් පිළිබඳ තොරතුරු

### 2.1 මුළු ජනගහනය

| ස්ත්‍රී | පුරුෂ | එකතුව |
|---|---|---|
| 19615 | 17820 | 37435 |

(ඇමුණුම * ජනගහන මූලික තොරතුරු)

### 2.2. ජනගහන ව්‍යාප්තිය

| සිංහල | ශ්‍රී ලාංකීය දෙමළ | ඉන්දියානු දෙමළ | මුස්ලිම් | මැලේ | බර්ගර් | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 37217 | 118 | 2 | 76 | 3 | 14 | 5 | 37435 |

#### 2.2.1 ජාතීන් අනුව

ඇමුණුම ( 1 ) ජනගහන ව්‍යාප්තිය ජාතීන් අනුව

### 2.3 ආගම් අනුව

| බෞද්ධ | කතෝලික | ක්‍රිස්තියානි | ඉස්ලාම් | හින්දු | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|
| 36561 | 463 | 235 | 75 | 86 | 15 | 37435 |

ඇමුණුම ( 2) ජනගහන ව්‍යාප්තිය - ආගම් අනුව

### 2.4 ජනගහන ව්‍යාප්තිය - වයස් කාණ්ඩ අනුව

| අවුරුදු 5 හා 5 ට අඩු | | අවුරුදු 6-18 | | අවුරුදු 19-60 | | අවුරුදු 60 වැඩි | | ඒකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | |
| 1060 | 1020 | 3196 | 3145 | 11148 | 10372 | 4196 | 3298 | 37435 |

ඇමුණුම (3 ) ජනගහන ව්‍යාප්තිය - වයස් කාණ්ඩ අනුව

### 2.5 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජන සනත්වය (වර්ග කිලෝමීටර් 1ට ජනගහනය)

| ජන සනත්වය (වර්ග කිලෝමීටර් 1 ට ) | | | |
|---|---|---|---|
| 2017 | 2018 | 2019 | 2020 |
| | 380.82 | 384.12 | 388.91 |

## 2.6 අධ්‍යාපන මට්ටම අනුව ජන සංඛ්‍යාව

| අනු අංකය | අධ්‍යාපන මට්ටම | ජන සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|---|
| 1 | අවු 5ට අඩු | 2097 | 5.6017096 |
| 2 | කිසිදා පාසල් නොගිය | 356 | 0.9509817 |
| 3 | ප්‍රාථමික (1-5 ) වසර | 5106 | 13.639642 |
| 4 | ද්විතියක (6-11) වසර | 11744 | 31.371711 |
| 5 | සා/පෙළ සමත් | 9239 | 24.680112 |
| 6 | උ/පෙළ සමත් | 6684 | 17.854949 |
| 7 | ඩිප්ලෝමාධාරි | 459 | 1.2261253 |
| 8 | උපාධි - i භෞතික විද්‍යා | 103 | 0.2751436 |
| | ii ජීව විද්‍යා | 168 | 0.4487779 |
| | iiiවාණිජ | 255 | 0.6811807 |
| | ivකලා | 917 | 2.4495793 |
| 9 | පශ්චාත්උපාධි | 47 | 0.125551 |
| 10 | වෙනත් | 260 | 0.6945372 |
| එකතුව | | 37435 | 100 |

ඇමුණුම 4 අධ්‍යාපන මට්ටම අනුව ජනගහනය

## 2.7 අධ්‍යාපන - මට්ටම් පදනම් කරගත් සේවා නියුක්තිය

| 8 ශ්‍රේණිය සමත් | | අ.පො.ස (සා/පෙළ) සමත් | | අ.පො.ස (උ/පෙළ) සමත් | | ඩිප්ලෝමාධාරි | | උපාධිධාරී | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ |
| 1837 | 3155 | 2539 | 3434 | 2298 | 2895 | 265 | 206 | 805 | 558 | 7744 | 10248 |

ඇමුණුම (5 ) අධ්‍යාපන මට්ටම පදනම් කරගත් සේවා නියුක්තිය

## 2.8 අධ්‍යාපන - මට්ටම පදනම් කරගත් සේවා වියුක්තිය

| 8 ශ්‍රේණිය සමත් | | අ.පො.ස (සා/පෙළ) සමත් | | අ.පො.ස (උ/පෙළ) සමත් | | ඩිප්ලෝමාධාරි | | උපාධිධාරි | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ |
| 2121 | 1060 | 1852 | 833 | 1180 | 482 | 34 | 22 | 12 | 9 | 5199 | 2406 |

ඇමුණුම (6) අධ්‍යාපන මට්ටම පදනම් කරගත්සේවා වියුක්තිය

## 2.9 රැකියාවන්ගේ බෙදී යාම

### 2.9..1 ආංශික වශයෙන්

| රාජ්‍ය අංශය | අර්ධ රාජ්‍ය | පෞද්ගලි ක අංශය | කෘෂි කාර්මික කටයුතු | ස්වයං රැකියා | විදේශ රැකියා | පතල් වැඩ, වතු වැඩ, කුලී වැඩ හා වෙනත් | එකතු ව |
|---|---|---|---|---|---|---|---|
| 3180 | 587 | 6666 | 1847 | 3279 | 609 | 1878 | 18046 |

ඇමුණුම (7) රැකියා බෙදීයාම අංශ වශයෙන්

## 2.10 විදේශ රැකියා

| විදේශ රැකියා | ලියාපදිංචි වී විදේශ ගතවු සංඛ්‍යාව | ලියාපදිංචි නොවී විදේශ ගතවු සංඛ්‍යාව |
|---|---|---|
| 1.පුහුණු ශ්‍රමිකයන් | 228 | 10 |
| 2.නුපුහුණු ශ්‍රමිකයන් | | |
| i.ගෘහ සේවිකා | 233 | 12 |
| ii.වෙනත් | 98 | 5 |
| 3.වෘත්තීයවේදීන් | 24 | 0 |

ඇමුණුම 08 - විදේශ රැකියා

## 2.11.පුහුණු ශ්‍රමයේ සේවා නියුක්තිය

| අනු අංකය | සේවා නියුක්ති අංශයන් | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | පරිගණක | 164 |
| 2 | පෙදරේරු | 525 |
| 3 | රියදුරු | |
| | 1 බර වාහන | 144 |
| | 11 සැහැල්ලු වාහන | 186 |
| | 111 ත්‍රිවිල් | 174 |
| 4 | වඩු කාර්මික | 113 |
| 5 | ඉලෙක්ට්‍රෝනික් යන්ත්‍ර අලුත් වැඩියාව | 31 |
| 6 | මැණික් කැපීම | 0 |
| 7 | පෙර පාසල් ගුරු පුහුණුව | 16 |
| 8 | යතුරු ලියනය | 4 |
| 9 | මැහුම් නැටුම් | 225 |
| 10 | ජුකී පුහුණුව | 281 |
| 11 | ගෘහ නිර්මාණ ශිල්පය | 10 |
| 12 | ක්‍රීඩා | 0 |
| 13 | ස්වර්ණාභරණ සැදීම | 2 |
| 14 | වෙළදාම | 237 |
| 15 | මෝටර් කාර්මික | 46 |
| 16 | සෞඛ්‍ය | 111 |
| 17 | තැපැල් | 17 |
| 18 | රූපලාවණ්‍ය | 31 |
| 19 | එම්බ්‍රොයිඩර් | 3 |
| 20 | විදුලි කාර්මික | 42 |
| 21 | මාධ්‍යවේදින් | 5 |
| 22 | වෙනත් | 7 |

ඇමුණුම 09 -පුහුණු ශ්‍රමයේ සේවා නියුක්තිය

## 2.12 පවුලක සාමාන්‍ය ආදායම

| ආදායම (රු) | මුළු පවුල් සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| 10000 ට අඩු | 2335 | 20.11024029 |
| 10001-20000 | 1596 | 13.74558608 |
| 20001-30000 | 1608 | 13.84893635 |
| 30001-40000 | 2064 | 17.77624666 |
| 40001-50000 | 1633 | 14.06424942 |
| 50001-60000 | 1066 | 9.1809491 |
| 60001-70000 | 707 | 6.089053484 |
| 80000 වැඩි | 602 | 5.18473861 |
| එකතුව | 11611 | 100 |

ඇමුණුම ( 30 ) පවුලක සාමාන්‍ය ආදායම ග්‍රාම නිලධාරී වසම් අනුව

## 2.13 නිවාස වල ස්වභාවය/අයිතිය

### නිවාස වල ස්වභාවය

| ස්ථිර | අර්ධ ස්ථිර | තාවකාලික | එකතුව |
|---|---|---|---|
| 9742 | 656 | 133 | 10531 |

ඇමුණුම ( 10 ) නිවාස වල ස්වභාවය ග්‍රාම නිලධාරී වසම් අනුව

## 2.14 නිවාස වල අයිතිය

| තමාගේම නිවසක් හිමි | හවුල් පදිංචි | කුලියට/බද්ධට පදිංචි | අනවසර ඉඩම්වල පදිංචි | රජයේ නිල නිවාසවල පදිංචි | පදිංචියට නිවසක් නැති | එකතුව |
|---|---|---|---|---|---|---|
| 10716 | 703 | 123 | 54 | 0 | 15 | 11611 |

ඇමුණුම (11 ) නිවාසවල අයිතිය ග්‍රාම නිලධාරී වසම් අනුව

## 2. 15 නිවාස පහසුකම්

| අනු අංකය | නිවාස යෝජනා ක්‍රමයේ නම | නිවාස සංඛ්‍යාව | ආධාර සැපයූ /ක්‍රියාත්මක කළ ආයතනය |
|---|---|---|---|
| | | | |
| නැත | | | |
| | | | |

## 3.කෘෂි කර්මාන්තය/ඉඩම් පරිහරණය

3.1 වී වගාව
3.1.1. කොට්ටාශයේ මුළු කුඹුරු ප්‍රමාණය (හෙක්ටයාර්) -3850 පමණ
3.1.2.පුරන් වූ කුඹුරු ප්‍රමාණය (හෙක්ටයාර්)
3.1.3. වගා කළ කුඹුරු ප්‍රමානය හා අස්වැන්න

| වගා කන්නය | | කුඹුරු ප්‍රමාණය (හෙක්) | මුළු අස්වැන්න (මෙ.ටො) |
|---|---|---|---|
| 2016 | යල | 2768.14 | 5451.2 |
| | මහ | 2825.94 | 5824.54 |
| 2017 | යල | 2743.84 | 5404.77 |
| | මහ | 2799.24 | 5695.59 |
| 2018 | යල | 2736.94 | 5395.87 |
| | මහ | 2844.34 | 5857.92 |
| 2019 | යල | 2620.14 | 3785.24 |
| | මහ | 2692.04 | 5701.65 |
| 2020 | යල | 2780.22 | 5708.17 |
| | මහ | 2927.66 | 5951.75 |

(ඇමුණුම 31)

## 3.1.4 වී වගාව සඳහා ජලය ලබාගන්නා ආකාරය

| ජලය ලබා ගන්න මාර්ගය | වගාකළ භූමි ප්‍රමාණය (අක්කර) | | |
|---|---|---|---|
| | මහකන්නය | යල කන්නය | එකතුව |
| 1.මහා වාරි මාර්ග (අක්කර.අඩි 800 වැඩි) | 0 | 0 | 0 |
| 2.මධ්‍ය වාරි මාර්ග (අක්කර.අඩි 200-800) | 0 | 0 | 0 |
| 2.සුළු වාරි මාර්ග (අක්කර.අඩි 200 අඩු) | 484.596 | 478.096 | 962.692 |
| 3.අහස්දියෙන් | 3361.8 | 3357.3 | 6719.1 |
| 4.උස්සාන වාරි | 0 | 0 | 0 |
| එකතුව | 3846.396 | 3835.396 | 7681.792 |

## 3.1.5 පොහොර වැඩසටහන

| වගාව | පොහොර වර්ගය | ලබා දෙන ලද පොහොර ප්‍රමාණය(මෙ.ටො) | |
|---|---|---|---|
| | | යල | මහ |
| වී වගාව | MOP | 15639.138 | 7896.381 |
| | TSP | 7896.381 | 58092.757 |
| | URIA | 58092.757 | 27575.347 |

### 3.1.6 පොහොර වැඩසටහන වෙනත් වගාවන් සඳහා

| වෙනත් වගාවන් | පොහොර වර්ගය | වාර්ෂිකව ලබා දෙන ලද පොහොර ප්‍රමාණය(මෙ.ටො) |
|---|---|---|
| නැත | MOP | |
| | TSP | |
| | URIA | |

### 3.1.7 වී වගාව සම්බන්ධව උද්ගතවී ඇති ගැටළු

1 කුඹුරු ඉඩම් වල ලවණතාව

2අවිධිමත් කෘෂිරසායන භාවිතය

### 3.1.8 වී වගාව ප්‍රවර්ධනය සඳහා කරන යෝජනා

* හොඳ තත්වයේ බිත්තර වී වර්ග හඳුන්වා දීම.
* කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම.
* කාබනික පොහොර නිෂ්පාදනය වැඩි කිරීම.

### 3.2 භෝග වගාව
### 3.2.1 ප්‍රධාන භෝග වගාව

| වගාව | වගා කර ඇති බිම් ප්‍රමාණය (අක්කර) | වාර්ෂික නිෂ්පාදනය(ඒකකය සඳහන් කරන්න) |
|---|---|---|
| පොල් | 9665 | 18714286 |
| තේ | 0 | |
| රබර් | 0 | |

### 3.2.2 පළතුරු භෝග වගාව

| භෝගය | බිම් ප්‍රමාණය (අක්කර) | | වාර්ෂික නිෂ්පාදනය (කි.ග්‍රෑ) |
|---|---|---|---|
| | තනි වගාවක් ලෙස | අතුරු වගාවක් ලෙස | |
| අන්නාසි | | 86.485 | 553280 |
| කෙසෙල් | | 61.775 | 433970 |
| අඹ | | 29.652 | 187200 |
| පැපොල් | | 32.123 | 112380 |
| දොඩම් | | 11.8608 | 33120 |
| කොමඩු | | 4.942 | 74100 |
| කජු | | 0 | 0 |
| ඩ්‍රැගන් ෆෘට් | | 0 | 0 |
| වෙනත්(වර්ගය සඳහන් කරන්න) | | 0 | 0 |
| පැෂන් | | 12.355 | 75000 |
| පේර | | 11.1195 | 41620 |

### 3.2.3 සුළු අපනයන භෝග වගාව

| භෝගය | බිම් ප්‍රමාණය (අක්කර) | නිෂ්පාදනය (කි.ග්‍රෑ) |
|---|---|---|
| ගම්මිරිස් | 49.5 | 1400 |
| කුරුඳු | 39.25 | 1600 |
| කහ | 5 | 2000 |
| ඉගුරු | 30 | 20000 |
| කරාබු නැටි | 0 | 0 |
| එනසාල් | 0 | 0 |
| කෝපි | 8 | 400 |
| වැනිලා | 0 | 0 |
| කොකෝවා | 0 | 0 |
| වෙනත්(වර්ගය සඳහන් කරන්න) | | |
| බුලත් | 4 | 1000 |

### 3.2.4 එළවළු වගාව

| බෝගය | වගාකරන ලද බිම් ප්‍රමාණය (අක්කර) | වාර්ෂික අස්වැන්න (කි.ග්‍රෑ) |
|---|---|---|
| මෑ | 6.59757 | 23740 |
| බෝංචි | 1.60615 | 4810 |
| බණ්ඩක්කා | 5.26323 | 21140 |
| මාලු මිරිස් | 4.79374 | 19160 |
| තක්කාලි | 2.00151 | 16000 |
| වම්බටු | 5.55975 | 33340 |
| තිබ්බටු | 2.29803 | 7330 |
| එලබටු | 0.19768 | 640 |
| වැටකොළු | 2.34745 | 18770 |
| පතෝල | 2.10035 | 16790 |
| කරවිල | 3.33585 | 26670 |
| දඹල | 0.39536 | 2370 |
| වට්ටක්කා | 0 | 0 |
| කැකිරි | 1.08724 | 8690 |
| පිපිඤ්ඤා | 1.16137 | 9280 |
| අළුකෙසෙල් | 0 | 0 |
| රාබු | 0.61775 | 8640 |
| ගෝවා | 0 | 0 |
| වෙනත්(වර්ගය සඳහන් කරන්න) | 0 | 0 |

### 3.2.5 අතිරේක ආහාර භෝග

| බෝගය | වගාකරන ලද බිම් ප්‍රමාණය (අක්කර) | වාර්ෂික අස්වැන්න (කි.ග්‍රෑ) |
|---|---|---|
| මඤ්ඤොක්කා | 0 | 0 |
| බතල | 0 | 0 |
| වෙනත් අල වර්ග | 0 | 0 |
| අමුමිරිස් | 12.03377 | 48110 |
| රටකජු | 12.8492 | 12840 |
| බඩ ඉරුඟු | 15.5673 | 31120 |
| කුරක්කන් | 1.9768 | 590 |
| තල | 0 | 0 |
| කවුපි | 31.1346 | 12440 |
| සෝයා | 0 | 0 |
| උඳු | 0 | 0 |
| රතුලූණු | 0 | 0 |
| මුං | 29.652 | 11850 |
| | | |

### 3.2.6 භෝග වගාව සම්බන්ධ ගැටළු

1 වන සත්ව හානිය

2 වෙළඳපල අලෙවිය පිළිබඳ ගැටළු

3 අවිධිමත් කෘෂිරසායන භාවිතය

### 3.2.7 භෝග වගාව ප්‍රවර්ධනය සඳහා කරන යෝජනා

1 වන සතුන් පලවාහරින විදුලි වැට ලබා දීම හා වායු රයිෆල් ලබා දීම

2 ආරක්ෂිත ගෘහ වල බෝග වගාව

3 පළිබෝධනාශක භාවිතය විධිමත් කිරීම

4 පාංශු සංරකෂණ ක්‍රම යෙදිම

### 3.2.8 විසිතුරු මල් වගාව

| අනු අංකය | වගාකරුවන් සංඛ්‍යාව | වාර්ෂික නිෂ්පාදනය(ඒකකය සඳහන් කරන්න) |
|---|---|---|
| ඇන්තූරියන් | 18 | පැල 1000/මල් 1500 |
| රෝස | 10 | පැල 800 |
| ඕකිඩ් | 20 | පැල 2000 |
| විසිතුරු පැළ | 23 | පැල 1000 |
| වෙනත්(වර්ගය සඳහන් කරන්න) | | |

## 3.2.9 පැල තවාන් - බීජ හා පැල නිෂ්පාදනය

| බීජ හා පැළ නිෂ්පාදන වර්ගය | තවාන්කරුවන් සංඛ්‍යාව | වාර්ෂික නිෂ්පාදනය (ඒකකය සඳහන් කරන්න) |
|---|---|---|
| සියළුම වර්ගයේ පැල (මල්/සුළු අපනයන/විසිතුරු ආදී) | 25 | පැල 8000 |
| | | |
| | | |

## 3.3 සත්ව පාලනය

**පශු සම්පත් මධයස්ථාන තොරතුරු**

| පශු සම්පත් මධ්‍යස්ථානයේ නම | ලිපිනය | පශු වෛද්‍ය නිලධාරිගේ නම | දුරකතන අංකය |
|---|---|---|---|
| **පශු වෛද්‍ය කාර්යාලය** | ගිනිපෙන්ද, කළුගමුව | කේ.ඒ.පී.ඒ. බණ්ඩාර | 373763692 |

## 3.3.2 සත්ව පාලව සංඛ්‍යා දත්ත

| සත්ව වර්ගය | ගොවිපළ සංඛ්‍යාව | | සතුන් සංඛ්‍යාව |
|---|---|---|---|
| | රජයේ | පෞද්ගලික | |
| 1.කුකුළන් | | 48 | 38340 |
| 2.එළගවයන් | | 20 | 497 |
| 3.මී ගවයන් | | 1 | 5 |
| 4.ඌරන් | | 1 | 4 |
| 5.එළුවන් | | 21 | 208 |
| 6.බැටළුවන් | | 1 | 50 |
| 7.කළුකුන් | | 2 | 13 |
| 8.වටුවන් | | 2 | 50 |
| වෙනත් | | 2 | 18 |

## 3.3.3 කුකුල් පාලනය -බිත්තර ලබාගැනීම

| | ගොවිපළ සංඛ්‍යාව | සතුන් සංඛ්‍යාව | වාර්ෂික නිෂ්පාදනය බිත්තර |
|---|---|---|---|
| බිත්තර දමන කිකිළියන් | 48 | 38340 | 979610 |
| වටු කිකිළියන් | 1 | 50 | 10500 |
| එකතුව | 49 | 38390 | 990110 |

## 3.3.4 සත්ව පාලනය -කිරි ලබාගැනීම

| සත්ව වර්ගය | සතුන් සංඛ්‍යාව | වාර්ෂික කිරි නිෂ්පාදනය (ලීටර්) | සතුන් ඇති කරන පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|
| මී ගවයන් | 5 | 1500 | 1 |
| එළ ගවයන් | 497 | 882080 | 424 |
| එළුවන් | | | |
| එකතුව | | | |

## 3.3.5 සත්ව පාලනය -මස් පිණිස

| සත්ව වර්ගය | සතුන් සංඛ්‍යාව | වාර්ෂික මස් නිෂ්පාදනය (කි.ග්‍රෑ) | සතුන් ඇති කරන පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|
| මස් සඳහා කුකුළන් (බ්‍රොයිලර්) | 300000 | 454750 | 15 |
| කළුකුන් | 13 | 0 | 2 |
| ඌරන් | 4 | 0 | 1 |
| එළුවන් | 208 | 2512 | 21 |
| බැටළුවන් | 50 | 0 | 1 |
| ගවයන් | 0 | 0 | 0 |
| වෙනත්( සඳහන් කරන්න) | | | |
| | | | |

## 3.3.6 පශු සම්පත් ආශ්‍රත නිෂ්පාදන

| සත්ව වර්ගය | සතුන් සංඛ්‍යාව | වාර්ෂික මස් නිෂ්පාදනය (කි.ග්‍රෑ) | සතුන් ඇති කරන පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|
| මස් සඳහා කුකුළන් (බ්‍රොයිලර්) | 300000 | 454750 | 15 |
| කළුකුන් | 13 | 0 | 2 |
| ඌරන් | 4 | 0 | 1 |
| එළුවන් | 208 | 2512 | 21 |
| බැටළුවන් | 50 | 0 | 1 |
| ගවයන් | 0 | 0 | 0 |
| වෙනත්( සඳහන් කරන්න) | | | |
| | | | |

## 3.3.7 සත්ව පාලනය සම්බන්ධ වෙනත් සේවාවන්

| සේවාව | සංඛ්‍යාව | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|
| කෘත්‍රිම සිංචන සේවා | 940 | |
| අභිජනන තත්ත්ව පරීක්ෂණ | 193 | |
| සත්ත්ව සෞඛ්‍ය උපදේශන | 12 | |
| ව්‍යාප්ති සේවා | 0 | |
| පුහුණු වැඩසටහන් | 12 | |
| සංවර්ධන ව්‍යාපෘති/යටිතල පහසුකම් | 1 | |
| වෙනත්( සඳහන් කරන්න) 0 | 0 | |

## 3.3.8 මිරිදිය ධීවර කර්මාන්තය

### 3.3.8.1 ජලජීවී මධ්‍යස්ථාන පිළිබඳ තොරතුරු

| ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ව්‍යාප්ති නිලධාරිගේ නම | සේවා ස්ථානයේ ලිපිනය | දුරකතන අංකය |
|---|---|---|
| | | |
| | | |

### 3.3.8.2 මිරිදිය ධීවර කර්මාන්තය පිළිබඳ තොරතුරු

| මිරිදිය ධීවර කර්මාන්තය සඳහා යොදා ගෙන ඇති වැවේ නම | කාලීන/ සෘතු ජලාශයක් | ජලාශයේ පරිමාව අක්.අඩි | තොටුපල සංඛ්‍යාව | ධීවර යාත්‍රා | | ධීවර පවුල් සංඛ්‍යාව | ධීවරයින් සංඛ්‍යාව | | වාර්ෂික මිරිදිය ඉස්සන් නිෂ්පාදනය (කි.ග්‍රෑ) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ඔරු | තෙප්පම් | | | | |
| නැත | | | | | | | | | |
| | | | | | | | | | |
| එකතුව | | | | | | | | | |

### 3.3.8.3 මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ආශ්‍රිත රැකියා

| වෘත්තිය | පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|
| 1.මසුන් ඇල්ලීම | |
| 2.මත්ස්‍ය වෙළඳාම -ජංගම | |
| 3.මත්ස්‍ය වෙළඳාම -වෙළඳසැල් | |
| 4.කරවල නිෂ්පාදන | |
| 5.විසිතුරු මත්ස්‍ය වගාව | |
| 6.විසිතුරු මත්ස්‍ය වෙළඳාම | |
| 7.විසිතුරු මත්ස්‍ය අපනයනය | |
| 8.ජලජ පැළෑටි වගාව | |
| 9.ජලජ පැළෑටි අපනයනය | |
| 10.ධීවර යාත්‍රා හා උපාංග නිෂ්පාදනය | |

### 3.3.8.4 ධීවර සමිති

| ධීවර සමිතියේ නම | ලියාපදිංචි අංකය | සාමාජිකයන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | | |
| 2 | | |

### 3.3.8.5 මත්ස්‍ය කර්මාන්තය ආශ්‍රිත තොරතුරු

i. මත්ස්‍ය අලෙවිසැල් සංඛ්‍යාව

ii. සුරතල් මසුන් අලෙවිසැල් සංඛ්‍යාව

iii සුරතල් මසුන් ඇති කරන ස්ථාන

iv මත්ස්‍ය සැකසුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව

v.මිරිදිය මසුන් අභිජනනය කිරිමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව

vi මිරිදිය මසුන් ඇති කිරිමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව

vii ජලජ පැළෑටි වගා ස්ථාන සංඛ්‍යාව

### 3.3.8.6 ජලාශවල මසුන් තැන්පත් කිරීම

| ජලාශයේ නම | තැන්පත් කල ඇඟිල්ලන් ගණන | තැන්පත් කල ඇසිත්තන් ගණන | තැන්පත් කල මිරිදිය ඉස්සන් ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |
| එකතුව | | | |

## 3.3.9 පශු වෛද්‍ය සේවා මධ්‍යස්ථාන

| සේවා ස්ථානයේ නම | ලිපිනය |
|---|---|
| පශු වෛද්‍ය කාර්යාලය | ගිනිපෙන්ද,කළුගමුව |
| | |

## 3.3.10 සත්ව පාලනය හා සම්බන්ධ ගැටළු

1. ප්‍රතිකාර හා සේවා ක්ෂේත්‍රයට ගොස් ලබාදිය යුතු  බැවින් තාර්යාලයට අයත් වාහනය ධාවනයට සුදුසු නොවීම.

2. 2019 වසර- කාර්යාලයට අයත්ව තිබූ 4057371 වාහනය අබලන් වූ අතර ධාවනය කරනු ලැබුවේ ඉතා සුළු දින ගණනකි.

3.2020 වසර- 53-9828 දරණ අළුත් වාහනය ලබාදී තිබුණත් ලියාපදිංචිය නොමැති නිසා ධාවනයට අවසර නොලැබුනි.

4. 2021 වසර- ධාවනයට අවසර ලැබී ඇත.රියදුරා නොමැත.

## 3.3.11 සත්ත්ව පාලන ප්‍රවර්ධනය සඳහා කෙරෙන යෝජනා

1. දෙපාර්තමෙන්තුව මගින් ලබා දෙන ඖෂධ හා සේවා නොමිළයේ ලබාදීම.

2. ක්ෂේත්‍ර ප්‍රතිකාර  හා සේවා අඛණ්ඩව ලබාදීම පිණිස රාංකාරී වාහනයට රියදුරකු ලබාදීම.

# 4. ඉඩම් පරිහරණය
## 4.1 කොට්ඨාසයේ මුළු වර්ග ප්‍රමාණය

| ව.කි.මි | හෙක්ටයාර් |
|---|---|
| 96.18 | 9618.33 |

## 4.2 භූමියේ අයිතිය අනුව

